කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011

2013 මැයි - අගෝස්තු

සමාජීය විද්‍යා පීඨය

භූගෝල විද්‍යාව - **GEOG- E 1025**

මානුෂ භූගෝල විද්‍යාව

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. මානුෂ භූගෝලවිද්‍යා විෂය ක්ෂේත්‍රයේ විකාශය පිළිබඳ අදහස් විවිධ ගුරුකුලවලට අවධානය යොමුකරමින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. මානව වර්ග පිළිබඳ අර්ථ දක්වා, එම මානව වර්ග හඳුනාගැනීමේ නිර්ණායකවල වලංගුභාවය පරීක්ෂා කරන්න. (ලකුණු 20)

03. අ) ආසියාතික රටවල ජනසංඛ්‍යා ව්‍යාප්තියේ අවකාශීය රටාව පහදන්න. (ලකුණු 06)

ආ) එම අවකාශීය රටාව කෙරේ බලපා ඇති පාරිසරික සාධක ගෙනහැර දක්වන්න. (ලකුණු 06)

ඇ) ඉහත 'අ' දැක්වූ අවකාශීය රටාව ආශ්‍රිතව පැනනැගී ඇති ගැටලු මොනවාද? (ලකුණු 08)

04. පසුගිය සියවසේ සංවර්ධනය වෙමින් පවත්නා රටවල ජන 'විද්‍යා සංක්‍රාන්තිය' (Demographic transition) සිදුවූ ආකාරය සහ ඒ ආශ්‍රිතව ඇතිවූ සමාජ- ආර්ථික ප්‍රතිඵල විමර්ශනය කරන්න. (ලකුණු 20)

05. 'සේවා කර්මාන්ත' (Service industries) හඳුන්වා, සංවර්ධනය වෙමින් පවත්නා රටවල එම අංශයෙහි මෑතකාලීන ප්‍රවණතා පැහැදිලි කරන්න. (ලකුණු 20)

06. 'පරිසර සංරක්ෂණය' පිළිබඳව ඉදිරිපත්ව ඇති මතවාද ඇසුරින් ඒවායේ තත්කාලීන ගෝලීය වැදගත්කම විමසන්න. (ලකුණු 20)

07. ඕනෑම රටක සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා බලපාන භූගෝලීය සාධකවල වැදගත්කම ඔබ විසින් තෝරාගත් එක් රටක් ඇසුරින් පරීක්ෂා කරන්න.

08. මතු සඳහන් ඒවායින් දෙකකට (02) සංක්ෂිප්ත සටහන් සපයන්න.

අ) කෘෂිකර්මාන්තය ආශ්‍රිත ජාන තාක්ෂණය

ආ) හරිත විප්ලවය ආශ්‍රිත සුළු ගොවීන්ගේ ගැටලු

ඇ) ගෝලීයකරණය ආශ්‍රිත කෘෂිකාර්මික ගැටලු

ඈ) කෘෂිකර්මාන්තය ආශ්‍රිත කාර්මික නිෂ්පාදන

(ලකුණු 10x2=20)

********************************